ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# ශ්‍රී ලංකා මහ බැංකුව ලෙස පෙනී සිටිමින් වංචනික විද්‍යුත් තැපැල් පණිවිඩ හුවමාරු කරන උත්සාහයක්

“Notice from Central Bank of Sri Lanka“ යන මැයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව නමින් ව්‍යාජ ලෙස පෙනී සිටිමින් ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන ඉලක්ක කරමින් වංචනික විද්‍යුත් තැපැල් පණිවිඩ හුවමාරු වෙමින් පවතින බවට ශ්‍රී ලංකා මහ බැංකුවට වාර්තා වී ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව විසින් එවන් කිසිදු දැනුම්දීමක් කිසිදු අයුරකින් හෝ සිදු කර නොමැති බව මහජනතාව සහ මූල්‍ය ආයතන වෙත දැනුම් දීමට කැමැත්තෙමු. තව ද, මෙවන් වංචනික විද්‍යුත් තැපැල් පණිවිඩ සම්බන්ධයෙන් අවදියෙන් සිටින මෙන් ශ්‍රී ලංකා මහ බැංකුව මහජනතාවගෙන් හා ආයතන වෙතින් ඉල්ලා සිටින අතර “Notice from Central Bank of Sri Lanka ” යන මැයෙන් ඔබ වෙතට පැමිණෙනු ලබන සැක කටයුතු විද්‍යුත් තැපැල් පණිවිඩ හෝ එහි ඇමුණුම් හෝ ඊට අදාළ සම්බන්ධක (Links) විවෘත කිරීමෙන් වළකින මෙන් අවවාද කර සිටිමු.

සන්නිවේදන දෙපාර්තමේන්තුව

2019 ජනවාරි 18